# පන්හිඳයි පින්සලයි



සිසිර දිසානායක

## අපේ අයගේ අපේ සින්දු

පන්හිඳයි, පින්සල්යි, පැන්සලයි තුන්දෙනාම මේ 2011 අවුරුද්ද ලබනකොට උන්නෙ ලංකාවේ තමුන්නෙ ගමේ තම-තමන්නෙ ගෙවල්වල. අලුත් දශකයක් ලබන වෙලාවක එහෙම ඉන්න ලැබෙන එක මොනතරම් දෙයක් ද?

"දෙසැම්බර් නිවාඩුව වැහි - සීතල මැද්දෙ වුණත් සතුටින් ගෙවුණා නේද ?" පන්හිඳ ලංකාවේ ඉඳන් ගෙනාව මළු අස්කරලා අව්වට දාන ගමන් ඇහුවා.

"පුංචි වුණත් ජයසිරි සේමගේ මහත්තයාගේ චිත්‍රය මට රත්තරං වටිනවා....." පින්සල චිත්‍රයත් එක්ක තිබුණ ඒ මහත්තයාගෙ අනික් චිත්‍රවල පින්තූර ටික බලනගමන් කිව්වා.

"පුදුමෙ කියන්නේ මේ ටී ෂර්ට් එකමට හරිගිය හැටිනෙ." පැන්සල තමන් අරන් ආව ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නිල කමිසය ඇඳගෙන කන්නාඩිය ඉස්සරහ  හැඩ වැඩ බැලුවා.

"මොනවා කිව්වත් මේ හැම දේකම අන්තිමට මටනම් ඇතිවෙන්නේ ලොකු පාළුවක්; සංකාවක්; ආයෙමත් දුවගෙන යන්න හිතෙනවා ගමටම. පන් කිව්වෙ හැඟීම් බරව.

"ඒක නං ඇත්ත. ඊත් ඉතිං පන් නම් එහෙම දුක් වෙන්න ඕනෙත් නෑනෙ. තමන් කරන කියන දේට ප්‍රතිචාර තිබුණානේ.....?"

"ඒක හරියට තමන්ගේ මව්ගෙන් ලැබෙන ආදරය වගේ දෙයක්. අම්මගෙ ආදරේට සමාන කරන්න පුළුවන් දෙයක් නෑ තමයි. ඊත් තමන් උපන්න රටේ තමන්ගේ මිනිස-'සුන්ගෙන් ලැබෙන ආදරයත් මටනම් දැනෙන්නේ අර විදියටමයි."

"තමන්ගේ අයට, තමන්ගේ දේට ආදරේ කරන අයට වරදින්න හේතුවක් නෑ. තමන්ටත් ඒ දේවල් ලැබෙනවා......" පැන් වුණත් තවම ඉන්නේ ගමේ සිහියෙන්. මොන දීපංකරවල කරක්ගහල ආවත් හිත වෙනස් කරගන්න බැරි හැටි අම්මපා.....

"පැන් කිව්ව දේ වැදගත්. අපි අතර මෙහෙත් ඉන්නවා අපේ දේට ආදරය කරන, අපේ දේ කරන්න උත්සහ කරන අය. අපේ ගීත කලාවට ආදරය කරන ගීත ගායනා කරන, තමන්ගේ ම සංගීත තැටි ඉදිරිපත් කරන අය ඒ දේවල් කරන්නෙ ජනප්‍රිය වෙන්නම, මහා ගායනා ශිල්පියො වෙන්නම නෙවී; ආත්ම තෘප්තියට; ආසාවට." පැන්ට ලංකාවේ සංගීත තැටියක් එළි දක්-වපු උත්සවයකදී කරපු කතාවක් මතක් වුණා. බ්‍රිස්බේන් නුවර ඉන්න උපමාලිකා කරුණාසේන හිතවතියගේ "මේ සඳමද ඔය අහසේ" සංගත තැටිය ජාතික චිත්‍රපට සංස්ථාවේ "තරංගනී" ශ්‍රවණාගාරයේ දී ජනවාරි 07 දා එළි දක්වපු උත්සවයයි ඒ. විශාරද නන්දා මාලිනී මහත්මියගේ මූලාසනයෙන් පැවැත් වුණ උත්සවයේ පන් ඇරෙන්න අනික් දේශනය කළේ ගීත රචක බන්දුල නානායක්කාරවසම් මහත්මයා. ප්‍රබුද්ධ, ප්‍රවීණ පිරිසක් ඉදිරියේදී පන් තමන්ගේ මාතෘකාව කරගත්තේ සංක්‍රමණය වෙලා ඉන්න අපේ අය අතින් කෙරෙන සින්දු ගැනයි. ඒ ගැන යමක් ලිව්වොත් හොඳාය කියලා පන්ට හිතුනා.

අතිශයින්ම කාර්ය බහුල වූ නුහුරු වටපිටාවක හුදකලාවන සංක්‍රමණිකයා තමා ලබනා සෑම ඉසිඹුවකදී ම තමන්ගේ දේ සොයා යාම ඕස්ට්‍රේලියාවට පමණක් ම සීමා වූවක් නොවේ. නූතන තොරතුරු තාක්‍ෂණයට පිහි-ටවන්නට අන්තර්ජාලය හරහා මව් රටේ පුවත්, කලා නිර්මාණ, හඹායන්නට පෙළඹුනා වූ සංක්‍රමණිකයන් කොතෙක් නම් වේ ද ? එක්වන්නට ඉඩක් ලද සෑම කල්හිම ඔවුන්ගේ මාතෘකාවන් වන්නේ මව් රටේ තොරතුරුයි. ඔවුන්ගේ සංකාව නසන්නේ මව් බිමේ කලාංගයි. ඒ සඳහා තමන්ගේ මහන්සියෙන් උපයාගන්නා දේ වියදම් කිරීමට කිසිම මැළිකමක් නැත්තේය ඔවුනට. තමුන්ට මඟ හැරී යන දේ මුදලින් හෝ තමා වෙත ළං කරගන්නට ඇත්නම් ?

මීවිත පිරී බඳුන් වටා රොක්ව තමනට මඟ හැරී යන දේ ළං කරගන්නට තතනනා අයගේ මුවින්



නිතැතින් ගිලිහෙන්නේ අපේ ම ගී පද රචනායි. අපේ කම තැවරුණ තනු අනුව ගැයුණ ගීතයි. මේ අය අතරින් ඉස්මතුවන ඇතැමෙක් තමන්ගේ ම ස්වතන්ත්‍ර ගී පිළිබඳව උනන්දු වෙයි. ඊට කාලය, මූල්‍යමය සම්පත් සහ නිර්මාණ සම්පත් සොයා ගනීයි. තමා ආයාසයෙන් ඉතිරි කරගන්නා කාලය, මුදල් යොදවාගෙන මව්බිමට පියඹා යන්නේ තමන් වඩාත් ආදරය කරනා නිර්මාපකයින්, ශබ්දාගාර, තාක්‍ෂණික ශිල්පීන් සොයාගෙනයි. මව්බිමේ කලාකරුවකු අතින් නිමැවුණ මහානර්ඝ කැටයමක්, සිතුවමක් තුරුළු කොටගෙන තමන් වෙසෙන දේශයට වඩමවන්නා සේ තමන්ගේ හඬින් ගැයුණු ගීයක්, දෙකක් හෝ පෙළක් ගෙන ඒමටයි ඔවුන්ගේ මේ ආශාව. එය මව්බිමේ වෙසෙන කලාකරුවනට ද අතිරේක ආදා-යම් මඟකි. එය මව් බිමෙන් අපනයනය කරනා නිර්මාණාත්මක වෙළඳ භාණ්ඩයක් බවට ද පත් නො-වන්නේ ද ? විදේශයකදී දහදිය මහන්සියෙන්, ශ්‍රද්ධා ශක්තියෙන් උපයාගත් මුදල් මව් බිමේදී වියදම් කරන්නට මෙවන් සංක්‍රමණික කලා ලෝලීන් ඉදිරිපත් වන්නේ කිසිඳු ලෝභකමකින් තොරවයි. කිසිඳු විටෙක "හෙට්ටු කිරීමක්" වනු ඇතැයි සිතිය නොහේ. තමන් ආදරය කරනා කලාකරුවන් ගේ නිර්මාණයක් වෙනුවෙනි. කරනා වියදම ඔවුනට නොදැනේ. ඒ වෙනුවෙන් ගතවෙන කාලය, වෙහෙස ඔවුනට නොදැනේ.

"හරියට පෙන්ගුවින් අයිලන්ඩ් එකේ පෙන්ගුවින්ලා වගේ.... පැන් පන්ගේ ලියවිල්ලට තමන්ගේ අදහසක් එකතු කළා.

"තමන්ගේ අඹු දරුවන්ට ඕන කරන කෑම ගේන්න පෙන්ගුවින්ලා තමන්ට හුරු පරිසරයට යන්න මොන තරම් දුක් කරදර වෙනවද ? ඒ වගේ තමයි අපේ අයත්. පෙරුම් පුරලා, පුරලා ලංකාවට ගිහින් සතියෙන් දෙකෙන් තමන්ට ඕන කරන දේ අරගෙන මේ රටවලට ඇවිල්ලා ඒවා තමුන්ගේ නෑ මිත්‍රයොත් එක්ක, අඹු දරුවොත් එක්ක රස විඳිනවා.

තම තමන්ගේ හැකියාවන් මොන මට්ටමක වුවද තමන්ට ගැලපෙන හොඳම දේ කර ගැනීමටයි මෙවන් කලාලෝලීන්ගේ එකම අභිප්‍රාය වන්නේ. එනයින් අවර ගණයේ ගීතයෝ නම් විරලයහ  අප අතර. මේ වන විට මව් බිමේ ඇති අවර ගී රැල්ලට හෝ "තරු" මානසිකත්වයට නතු නොවී තමන්ට හැකි තරමින් යහපත් යමක් ඉදිරිපත් කිරීමයි. ඔවුනගේ අභිප්‍රාය වන්නේ. කෙතරම් දක්‍ෂයින් වුව ද අන් අය ගැයූ ගීවලින් මතු වූ "තරු" අතරින් අනන්‍යතාවයක් ගොඩනගාගත් නවකගේ විරලයහ මව්බිමේ ඒ අනුව බලන කල අප අතර සිටිනා ගී ලෝලීන් ගන්නා අවංක උත්සාහය ප්‍රශස්තයි. ඔවුහු ඒ වෙනුවෙන් කැපවෙති. ඇතැමෙකු ඒ දේ හදාරති. සබඳතාවන් පවත්වාගෙන යති

සංක්‍රමණය වී මාස කීපයකින් සිංහල මව් බස උසුරුවන්නට නොහැකි වන, නොහැකි සේ හඟවන, උප සමාජකුලයක ඒ දේ හරියාකාරව කරමින් ගයන්නට ඉදිරිපත්වන, ගයන දේ වටහා ගන්නට උනන්දුවන පිරිසි පිළිබඳව අපවෙත ඇත්තේ ප්‍රසන්න වූ හැඟීමක්.

උපමාලිකාවගේ සංයුක්ත තැටි එළිදැක්වීම සේම ඉදිරියේදී මෙල්බර්න් නුවර කෙල් වොට්සන් ශාලාවේදී "රූ සර ගී" ප්‍රසංගයෙන් එළි දැක්වෙන " තාරකාවියේ " ගී එකතුවද ඉහත කී දුෂ්කර ගමන් මගෙහි වසර ගණනාවක් තිස්සේ ආ ගමනක ප්‍රතිඵයක්. "තාරකාවියේ " ගී එකතුව රුක්මන් විමලසූරිය නම් වූ අපගේ මෙල්බර්න් සහෘදයාගේ ගායනා එකතුවක්. ඉහත කී ගමන් මගෙහිම සෙමෙ-න් සෙමෙන් ඉදිරියට එන තවත් එවන් ගී ලෝලියෙකු අප හට උපමාලිකාගේ උත්සවයේදී  මුණ ගැසිණ. ඒ අප හා මෙල්බර්න් නුවර වෙසෙන නන්දන ඇතුලත්මුදලි සහෘදයායි. ඔවුන් සෑම දෙනාටම ජය පතන්නෙමු අපි.


අතිල් ගුණසේකර මෙහෙයවන
VINSARA අධ්‍යාපන ආයතනයේ
Specialist Maths
Maths Methods
Further Mathematics
Physics
English
Literature
Chemistry
Accounting
යන විෂයයන් සඳහා 2011 VCE විභාගය වෙනුවෙන් උපකාරක පන්ති
2010 නොවැම්බර් මාසයේදී ආරම්භවේ.
ඒ සඳහා සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.
තවද
ඉහත විෂයයන් සඳහාම 11 වසර වෙනුවෙන්ද
6 වසරේ සිට 10 වසර දක්වා
Maths
English
Science
යන විෂයයන් සඳහාද සිසුන් බඳවා ගැනීම දැන් සිදුකෙරේ.
VINSARA Institute of Education
"Helping you to achieve your best"
4, Station Road
Rosanna , VIC 3084
Tel: 0433 11 3836, 9456 9552, Fax: 9456 9553
( ABN: 36 898 149 733 )
www.vinsara.com.au



Bring your Nephew/Niece/Brother or Sister to
STUDY IN AUSTRALIA
"STUDY HOSPITALITY, TOURISM, RESORTS, EVENTS OR COOKERY" At
William Angliss Institute
CRICOS:01505M
"DIPLOMA, ADVANCED DIPLOMA, AND BACHELOR DEGREE COURSES ARE AVAILABLE".
This Institute is specialist centre for
Hospitality, Tourism and Culinary Arts.
For Total Free Visa Processing
SHEFFIELD EDUCATION CONSULTANCY
QEAC Qualified Education Agent Counsellor
Australia:
P.O.Box 193,
Chadstone Shopping Centre,Chadstone,
VIC-3148.
Tel:+94 387075627, +61 387075627
Sri Lanka:
91/4 Maharagama RD
Piliyandala
Tel:+94 11 2616125
0777 838403
1/1 Trinity Gardens
Pallekelle, Kundasale, Kandy
Tel:+94 812420418
0777 802065
FLEX Graphic
Email : Sheffield.officers@gmail.com | Web : www.sheffieldeducation.com